සියලු ම හිමිකම් ඇවිරිණි]
முழுப் பதிப்புரிமையுடையது]
All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம் இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka Department of Examinations, Sri Lanka Department of Examinations, Sri Lanka

**5**

EXAMINATION FOR GRADE FIVE STUDENTS FOR SELECTION TO SCHOOLS AND FOR THE AWARD OF BURSARIES, AUGUST 2018

# පාසල්වලට සිසුන් තෝරාගැනීමට සහ ශිෂ්‍යාධාර ප්‍රදානය කිරීමට පස්වැනි ශ්‍රේණියේ සිසුන් සඳහා පැවැත්වෙන විභාගය, 2018 අගෝස්තු

## I පත්‍රය

මිනිත්තු 45 යි.

papers lanka.com

විභාග අංකය ..............................

**විභාගයට පෙනී සිටින ඔබට උපදෙස්:**

* ඔබේ **විභාග අංකය** ඉහත කොටුව තුළ ඇති **තිත් ඉර** මත ලියන්න.
* **තුන්වැනි පිටුවේ** ඇති නියමිත ස්ථානයේ ද ඔබේ **විභාග** අංකය ලියන්න.
* මෙම ප්‍රශ්න පත්‍රයේ ප්‍රශ්න 40ක් ඇත. **ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු මෙම ප්‍රශ්න පත්‍රයේ ම** සපයන්න.
* සෑම ප්‍රශ්නයකට ම පිළිතුරු **තුන** බැගින් දී ඇත. ඒවා අතුරෙන්, එක් එක් ප්‍රශ්නයට අදාළ **නිවැරදි පිළිතුර තෝරාගෙන ඊට යටින් ඉරක් අඳින්න.**
* කටුවැඩ කිරීම සඳහා කඩදාසියක් සපයනු ලැබේ.


**උත්තර පත්‍ර පරීක්ෂකවරුන් සඳහා පමණි.**


| පිටු අංකය | ලැබූ ලකුණු |
|---|---|
| 2 | |
| 3 | |
| 4 | |
| 5 | |
| 6 | |
| 7 | |
| 8 | |
| එකතුව | |
| අවසාන ලකුණ | |
| ඉලක්කමෙන් | |
| අකුරෙන් | |


| | කෙටි අත්සන හා සංකේත අංකය |
|---|---|
| **පළමුවන පරීක්ෂක** ලකුණු දීමේ පටිපාටිය අනුව උත්තර පත්‍රය ඇගයීම කළ බව සහතික කරමි. | V/I/S |
| **දෙවන පරීක්ෂක** පළමුවන පරීක්ෂක කර ඇති ඇගයීම් නිවැරදි බව සහතික කරමි. | V/I/S |
| **ඇගයීම් ලකුණු තහවුරු කිරීමේ පරීක්ෂක** ඇගයීම් කර, ප්‍රදානය කළ ලකුණු සහ අවසාන ලකුණ නිවැරදි බව තහවුරු කරමි. | V/I/S/EMF |
| **ප්‍රධාන පරීක්ෂක** අධීක්ෂණය කළෙමි. අවසාන ලකුණ නිවැරදි ය. | V/I/S/CH |


(දෙවැනි පිටුව බලන්න


● අංක 1 සහ 2 ප්‍රශ්න සඳහා මුලින් දී ඇති රූපයට සමාන රූපය තෝරන්න.


1. 



(1)



(2)


(3)

2. 



(1)



(2)



(3)

● අංක 3 සහ 4 ප්‍රශ්නවල රූප මගින් පෙන්වා ඇති සතුන් සහ උපකරණ යම් ලක්ෂණයක් මත කාණ්ඩ දෙකකට බෙදා ඇත. එම කාණ්ඩ නිවැරදිව දැක්වෙන පිළිතුර කුමක් ද?

3. 
A



B


C



D


(1) A B සහ C D (2) A C සහ B D (3) A D සහ B C


4. 
A


B


C


D


E


F

(1) A, D, E සහ B, C, F (2) A, D, F සහ B, C, E (3) B, D, F සහ A, C, E

● අංක 5 සහ 6 ප්‍රශ්නවල හිස්තැනට සුදුසු පිළිතුර තෝරන්න.

5. පහනට සහ ඉටිපන්දමට ආලෝකය ලෙස පොතට සහ සඟරාවට ......................

(1) ඇනුම (2) කියවීම (3) බැලීම

6. කියතට, මිටියට සහ යතුකැටයට වඩුවා ලෙස කැත්තට, උදැල්ලට සහ නගුලට ......................

(1) ධීවරයා (2) පෙදරේරුවා (3) ගොවියා

(තුන්වැනි පිටුව බලන්න

● වචන සහිත කාඩ්පත් තබා ඇති රටාව තේරුම් ගෙන අංක 7 සහ 8 ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

| මල්ල | ලස්සන | තළාව | වඳුරා | රාක්කය | | රබාන |
|---|---|---|---|---|---|---|

**7.** හිස් කාඩ්පතට සුදුසු වචනය තෝරන්න.

(1) කතුර　　(2) යතුර　　(3) රථය

**8.** [තළාව] වෙනුවට යෙදිය හැකි කාඩ්පත තෝරන්න.

(1) [නදිය]　　(2) [නළය]　　(3) [නටුව]

● පහත කවිය කියවා අංක **9** සහ **10** ප්‍රශ්න සඳහා පිළිතුරු සපයන්න.

සිතට සවිය අර　　ගන්නේ
ගතට දිරිය ලැබ　　ගන්නේ
වැඩට මැළිය දුර　　ලන්නේ
රටට ඉසුර නුඹ　　වන්නේ

**9.** මෙම කවියේ **සමස්ත** අදහස මගින් දෙනු ලබන පණිවුඩය කුමක් ද?

(1) කම්මැලිකම දුරලන්න.
(2) වෙහෙස වී වැඩ කරන්න.
(3) රටට වටිනා පුද්ගලයකු වන්න.

**10.** කවියට අනුව, රටට ඉසුර වන අයකු තුළ දැකිය හැකි ලක්ෂණ **දෙකක්** වන්නේ,

(1) සිතට ශක්තිය ගැනීම සහ වැඩට කම්මැලි නොවීම ය.
(2) සිත දියුණු කර ගැනීම සහ ශරීරය වර්ධනය කර ගැනීම ය.
(3) සිතට දිරිය ගැනීම සහ ශරීරය වර්ධනය කර ගැනීම ය.

**11.** ගස් නැතිදා දිය නැත - දිය නැතිදා අප නැත
ගස් රැකීම මිහි මත - යුතුකම වෙයි අප අත

මෙම කවියේ **සමස්ත** අදහසින් පැවසෙන්නේ,

(1) ජල සම්පත රැක ගත යුතු බවයි.
(2) ජලය නැති දා ගස් නැති බවයි.
(3) වන සම්පත රැක ගත යුතු බවයි.

**12.** **"ඇවිලෙන ගින්නට පිදුරු දැමුවා වගෙයි"** යන යෙදුම පැහැදිලි කරන ප්‍රකාශය කුමක් ද?

(1) අවශ්‍ය අවස්ථාවලදී උදව් කිරීමට ඉදිරිපත් වීම
(2) ගැටලුවක් විසඳීමට අවශ්‍ය ලෙස මැදිහත් වීම
(3) ගැටලුවක් තව තවත් වැඩි කිරීමට කටයුතු කිරීම

**13.** තමාගේ කටයුතුවල පමණක් නිරතවන නිමල්, අන් අය ඇසුරු කිරීමට හෝ ලෝකයේ සිදුවන දෑ පිළිබඳව සොයා බලා දැනුවත් වීමට හෝ උත්සාහ නොකරයි. මේ සඳහා ගැළපෙන **ප්‍රස්තාව පිරුළ** කුමක් ද?

(1) කල දුටු කල වළ ඉහ ගතියි
(2) ළිඳේ ඉන්න මැඩියා වගෙයි
(3) ජන්මෙට වඩා පුරුද්ද ලොකුයි

(හතරවැනි පිටුව බලන්න

**14.** ඉලක්කම් වෙනුවට සංකේත යොදා "හයසිය තිස් අට" ලියා ඇත්තේ පහත පරිදි ය.

638 ⟶ ✷ # ⊗

එම සංකේත භාවිත කර සෑදිය හැකි විශාලම සංඛ්‍යාව දැක්වෙන පිළිතුර තෝරන්න.

(1) ⊗ ✷ #  (2) ✷ ⊗ #  (3) ⊗ # ✷

**15.** සුනිල්ගේ නංගි අමාලි ය. ඇයට සහෝදරයෝ තිදෙනෙක් හා සහෝදරියෝ දෙදෙනෙක් සිටිති. සුනිල්ට සිටින සහෝදරයන් ගණන හා සහෝදරියන් ගණන කීය ද?

(1) සහෝදරයන් 2යි, සහෝදරියන් 2යි.

(2) සහෝදරයන් 2යි, සහෝදරියන් 3යි.


(3) සහෝදරයන් 3යි, සහෝදරියන් 3යි.

**16.** ● ■ ■ ▲ යන සංකේත යොදාගෙන **හරසර** යන වචනය ලියා තිබුණි.

ඒ අනුව ■ ▲ ● සංකේත මගින් අදහස් කරන වචනය කුමක් ද?

(1) රහස  (2) රසය  (3) සහන

**17.** දැල්වෙන ඉටිපන්දමක උස, එය දැල්වූ මොහොතේ සිට ගත වූ කාලයත් සමග වෙනස් වන ආකාරය පහත දැක්වේ.




මේ අනුව ඉටිපන්දම තව කොපමණ වේලාවක් දැල්වේ යැයි අනුමාන කළ හැකි ද?

(1) මිනිත්තු 5  (2) මිනිත්තු 10  (3) මිනිත්තු 15

**18.** පෙරේදා බදාදා ය. අමරගේ උපන් දිනය යෙදී ඇත්තේ අනිද්දාට ය. අමරගේ උපන් දිනය යෙදී ඇති දවස කුමක් ද?

(1) සෙනසුරාදා  (2) ඉරිදා  (3) සඳුදා

**19.** පහත සටහන අනුව හිස්තැන් දෙකට ගැළපෙන රූප **දෙක** අයත් පිළිතුර තෝරන්න.


F ⟶ Ⅎ නම් P ⟶ ................

E ⟶ Ǝ නම් C ⟶ ................

(1) ꟼ හා Ↄ  (2) P හා Ↄ  (3) ꟼ හා ᴗ

(පස්වැනි පිටුව බලන්න

රූපයේ දී ඇත්තේ සෑම පැත්තකම තීන්ත ආලේප කර ඇති ඝන ලී කුට්ටියකි. එය කඩ ඉරි දිගේ කපා කුඩා ලී කුට්ටි සමූහයක් ලබා ගන්නා ලදී. එය ඇසුරෙන් අංක **20** සහ **21** ප්‍රශ්න සඳහා පිළිතුරු සපයන්න.




**20.** කඩ ඉරි දිගේ කැපීමෙන් කුඩා ලී කුට්ටි කීයක් ලැබේ ද?

(1) 21     (2) 36     (3) 42

**21.** එක් පැත්තක පමණක් තීන්ත ආලේප වී ඇති කුඩා ලී කුට්ටි කීයක් ලැබේ ද?

(1) 8     (2) 10     (3) 12

**22.** හිස් කොටුවට ගැළපෙන රූපය තෝරන්න.





(1)


(2)


(3)

**23.** හිස් කොටුවට ගැළපෙන රූපය තෝරන්න.





(1)


(2)


(3)


**24.** සමචතුරස්‍ර කඩදාසියක් ගෙන A රූපයේ දැක්වෙන පරිදි කඩ ඉර දිගේ හරි මැදින් දෙකට නවා B රූපයේ දැක්වෙන පරිදි කඩ ඉර දිගේ කපා කැබලි කරන ලදී.

කඩදාසිය කඩ ඉර දිගේ නැමීම



A රූපය

නැවූ කඩදාසිය
කඩ ඉර දිගේ කැපීම



B රූපය

ලැබෙන කැබලි පිළිබඳ නිවැරදි ප්‍රකාශය කුමක් ද?


(1) ත්‍රිකෝණ කැබලි තුනකි.

(2) ත්‍රිකෝණ කැබලි හතරකි.

(3) සෘජුකෝණාස්‍ර කැබැල්ලක් සහ ත්‍රිකෝණ කැබලි දෙකකි.

(හයවැනි පිටුව බලන්න

**25.** පහත දී ඇති හැඩය සමචතුරස්‍රයක් බවට පත් කිරීම සඳහා එකතු කළ යුතු අඩුම කොටු සංඛ්‍යාව කීය ද?



(1) කොටු 5 (2) කොටු 9 (3) කොටු 10

**26.** මම බස්රථයකට ගොඩවීම සඳහා පෝලිමක සිටියෙමි. මට ඉදිරියෙන් 6 දෙනෙක් ද මට පිටුපසින් 4 දෙනෙක් ද වූහ. මගේ යහළුවා පෝලිමේ හරි මැද සිටියේ නම් ඔහු සිටියේ පෝලිමේ කී වෙනියාට ද?

(1) 5 වෙනියාට ය. (2) 6 වෙනියාට ය. (3) 7 වෙනියාට ය.


**27.** කවියක පද පේළි හතරක් මාරු කර ලියා ඇති අයුරු පහත දැක්වේ.

A - මිහිමත පැළයක් ඉන්දා
B - මතු පරපුර රැකෙයි සදා
C - උපන් දිනය සමරන දා
D - රැක ගත්තොත් එය සැමදා


අර්ථවත් කවියක් ලැබෙන සේ ගැළපූ විට එම පද පේළිවල නිවැරදි අනුපිළිවෙළ වන්නේ,


(1) B, D, A, C ය. (2) C, A, D, B ය. (3) D, C, B, A ය.


**28.** රූපයේ දැක්වෙන්නේ ඉරටු කැබලි හතරකි.



එම ඉරටු කැබලි හතර යොදා ගනිමින් සැකසිය හැකි හැඩයක් දැක්වෙන රූපය කුමක් ද?

(1) 

(2) 

(3) 

**29.** නිමල්, නාදන්, මීනා හා කුමාරි යන සිසු සිසුවියන් හතර දෙනා අතුරෙන් දෙදෙනෙකු තෝරා ගැනීමට ගුරුතුමියට අවශ්‍ය වී තිබේ. ඇයට ඒ සඳහා එකිනෙකට වෙනස් තේරීම් කළ හැකි ආකාර කීයක් තිබේ ද?

(1) 2 (2) 4 (3) 6


**30.** පළමුවන හා දෙවන හිස්තැන් සඳහා පිළිවෙළින් වඩාත් සුදුසු වචන යුගලය තෝරන්න.

ශ්‍රී ලංකාවේ වන සම්පත සීඝ්‍රයෙන් ................. නිසා වල් අලි තර්ජන ..................... වී ඇත.

(1) අඩු වීම, උග්‍ර
(2) ආරක්ෂා වීම, පාලනය
(3) පැතිරීම, දියුණු

(හත්වැනි පිටුව බලන්න

- පාසලක ස්ථාන කිහිපයක පිහිටීම සහ එම ස්ථානවලට යන මාර්ග දැක්වෙන දළ සටහනක් පහත දැක්වේ. එය ඇසුරෙන් අංක **31** සහ **32** ප්‍රශ්න සඳහා පිළිතුරු සපයන්න.




**31.** ළමයකු උදෑසනක ප්‍රධාන දොරටුවෙන් පාසලට පිවිසෙන විට ඔහුගේ දකුණු අත දෙසින් ඉර පායාගෙන එමින් තිබුණි. ඒ අනුව පුස්තකාලය පිහිටා ඇත්තේ පන්තියට කුමන දිශාවෙන් ද?

(1) උතුරු (2) බස්නාහිර (3) දකුණු

**32.** ළමයකු ප්‍රධාන දොරටුවේ සිට තම පන්තියට යන විට වම් පසටත් දකුණු පසටත් හැරෙන වාර ගණන කීය ද?

(1) වම් පසට 3 යි දකුණු පසට 2 යි
(2) වම් පසට 2 යි දකුණු පසට 3 යි
(3) වම් පසට 4 යි දකුණු පසට 3 යි

**33.** 49 සිට 99 තෙක් ඇති ගණිත සංඛ්‍යා ලිවීමේදී 5 ඉලක්කම ලිවිය යුතු වාර ගණන කීය ද?

(1) 10 (2) 14 (3) 15

**34.** $4 \ast 2 = 4 \star 2$ ගණිතමය සම්බන්ධතාවයේ $\ast$ හා $\star$ සංකේත සඳහා භාවිත කර ඇති ගණිත කර්ම දෙක මොනවා ද?

(1) $+$ හා $\times$ (2) $+$ හා $\div$ (3) $-$ හා $\div$

**35.** හදිසි ආපදා තත්ත්වයක් නිසා මැයි 14 වන සඳුදා සිට සෙනසුරාදා හා ඉරිදා ඇතුළුව නොකඩවාම දින 9 ක් පාසලක් වසා තබන ලදී. එම පාසල නැවත විවෘත කරන ලද්දේ,

(1) මැයි 22 වන අඟහරුවාදා ය.
(2) මැයි 23 වන අඟහරුවාදා ය.
(3) මැයි 23 වන බදාදා ය.

**36.** කොළඹ සිට යාපනය බලා ගමන් කළ බස්රථයක් නගර කිහිපයක් පසු කළ ආකාරය පහත දැක්වේ.

"මාරවිල නගරය පසු කළේ පූනෑව නගරය පසු කිරීමට පෙර ය. පූනෑව නගරය පසු කිරීමෙන් පසුව මාන්කුලම් නගරය පසු කරන ලදී."

බස්රථය යාපනයේ සිට කොළඹ බලා එම මාර්ගයේම ආපසු පැමිණෙන විට එම නගර පසුකරන අනුපිළිවෙළ කුමක් ද?

(1) පූනෑව, මාන්කුලම්, මාරවිල
(2) මාරවිල, පූනෑව, මාන්කුලම්
(3) මාන්කුලම්, පූනෑව, මාරවිල

(අටවැනි පිටුව බලන්න

37. ළමයකුගේ නිවසේ සිට පාසලට ඇති දුර මීටර 500 කි. ඔහු උදෑසන පාසල් යන විට මුළු දුරෙන් හරි අඩක් ගොස් ආපසු නිවසට පැමිණ නැවත පාසලට ගියේය. ඔහු ගමන් කළ මුළු දුර,


(1) මීටර 750 කි. (2) මීටර 1000 කි. (3) මීටර 1250 කි.

38. සමිතියක සාමාජිකයෝ දහදෙනෙක් සිටිති. සෑම මාසයකට වරක් ම සාමාජිකයන්ගේ නාම ලේඛනයේ අනුපිළිවෙළට එක් එක් සාමාජිකයාගේ නිවසේ සමිති රැස්වීම පැවැත්වේ. පළමුවන සාමාජිකයාගේ නිවසේ රැස්වීම පැවතියේ පෙබරවාරි මාසයේදී ය. ඔහුගේ නිවසේ මීළඟට රැස්වීම පැවැත්වෙන්නේ කවර මාසයේ ද?

(1) ඔක්තෝබර් (2) නොවැම්බර් (3) දෙසැම්බර්

39. ළමයකු සතියක් තුළ තම පාසල අවට ප්‍රදේශයේ අව්ව හා වැස්ස පැවති ආකාරය රූප මගින් සටහන් කර තිබූ අයුරු පහත දැක්වේ.

| සඳුදා | අඟහරුවාදා | බදාදා | බ්‍රහස්පතින්දා | සිකුරාදා | සෙනසුරාදා | ඉරිදා |
|---|---|---|---|---|---|---|



එම සතියේ කාලගුණ තත්ත්වය පිළිබඳ නිවැරදි ප්‍රකාශය කුමක් ද?

(1) තද වැසි පැවති, ඉර අව්ව නොලැබුණු සතියකි.

(2) හොඳින් වැස්ස ලැබුණු, එසේම ඉර අව්ව ද පැවති සතියකි.

(3) වැඩි දින ගණනක් ඉර අව්ව නොමැතිව වැසි ලැබුණු සතියකි.

40. පසුම්බියක රුපියල් 640 ක මුදලක්, මුදල් නෝට්ටු හතරකින් තිබේ. එහි ඇත්තේ,

(1) රුපියල් 500, රුපියල් 100 සහ රුපියල් 20 ඇතුළත් මුදල් නෝට්ටු 4 කි.

(2) රුපියල් 500 සහ රුපියල් 20 ඇතුළත් මුදල් නෝට්ටු 4 කි.

(3) රුපියල් 500, රුපියල් 50 සහ රුපියල් 20 ඇතුළත් මුදල් නෝට්ටු 4 කි.

***

සියලු ම හිමිකම් ඇවිරිණි]
முழுப் பதிப்புரிமையுடையது]
All Rights Reserved]

**ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව**
**இலங்கைப் பரீட்சைத் திணைக்களம்**
**Department of Examinations, Sri Lanka**

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம் இலங்கைப் பரீட்சைத் திணைக்களம் இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka Department of Examinations, Sri Lanka Department of Examinations, Sri Lanka Department

**5**

**EXAMINATION FOR GRADE FIVE STUDENTS FOR SELECTION TO SCHOOLS AND FOR THE AWARD OF BURSARIES, AUGUST 2018**

**පාසල්වලට සිසුන් තෝරාගැනීමට සහ ශිෂ්‍යාධාර ප්‍රදානය කිරීමට පස්වැනි ශ්‍රේණියේ සිසුන් සඳහා පැවැත්වෙන විභාගය, 2018 අගෝස්තු**

# II පත්‍රය

**පැය 1 යි මිනිත්තු 15 යි.**

papers lanka.com

**විභාග අංකය :** ..................................

**විභාගයට පෙනී සිටින ඔබට උපදෙස්:**

- ✳ ඔබේ **විභාග අංකය** ඉහත කොටුව තුළ ඇති **තිත් ඉර මත** ලියන්න.
- ✳ **තුන්වැනි පිටුවේ** ඇති නියමිත ස්ථානයේ ද ඔබේ **විභාග අංකය** ලියන්න.
- ✳ මෙම ප්‍රශ්න පත්‍රයේ ප්‍රශ්න 60 ක් ඇත. සමහර ප්‍රශ්නවල අනුකොටස් ද ඇත.
- ✳ **ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු මෙම ප්‍රශ්න පත්‍රයේ ම** සපයන්න.
- ✳ පිළිතුරු ලියන ලෙස උපදෙස් දී ඇති ප්‍රශ්නවලට **තිත් ඉරි මත** පිළිතුරු ලියන්න.
- ✳ පිළිතුරට යටින් ඉරක් අඳින්න යැයි උපදෙස් දී ඇති ප්‍රශ්නවල **නිවැරදි පිළිතුර තෝරාගෙන ඊට යටින් ඉරක් අඳින්න.**
- ✳ කටුවැඩ කිරීම සඳහා කඩදාසියක් සපයනු ලැබේ.

**උත්තර පත්‍ර පරීක්ෂකවරුන් සඳහා පමණි.**

| පිටු අංකය | ලැබූ ලකුණු |
|---|---|
| 2 | |
| 3 | |
| 4 | |
| 5 | |
| 6 | |
| 7 | |
| 8 | |
| එකතුව | |
| අවසාන ලකුණ | |
| ඉලක්කමෙන් | |
| අකුරෙන් | |

| | කෙටි අත්සන හා සංකේත අංකය |
|---|---|
| **පළමුවන පරීක්ෂක** ලකුණු දීමේ පටිපාටිය අනුව උත්තර පත්‍රය ඇගයීම් කළ බව සහතික කරමි. | V/II/S |
| **දෙවන පරීක්ෂක** පළමුවන පරීක්ෂක කර ඇති ඇගයීම් නිවැරදි බව සහතික කරමි. | V/II/S |
| **ඇගයීම් ලකුණු තහවුරු කිරීමේ පරීක්ෂක** ඇගයීම් කර, ප්‍රදානය කළ ලකුණු සහ අවසාන ලකුණ නිවැරදි බව තහවුරු කරමි. | V/II/S/EMF |
| **ප්‍රධාන පරීක්ෂක** අධීක්ෂණය කළෙමි. අවසාන ලකුණ නිවැරදි ය. | V/II/S/CH |

[දෙවැනි පිටුව බලන්න.

**1.** පහත දැක්වෙන ඡේදය කියවන්න.

මිනිසාගේ ආහාර අතුරෙන් බත්, රොටී, අල වර්ග ශක්තිජනක ආහාර කාණ්ඩයටත් කිරි, බිත්තර, මාළු, පරිප්පු වර්ධක ආහාර කාණ්ඩයටත් එළවලු, පලා, පලතුරු ආරක්ෂක ආහාර කාණ්ඩයටත් අයත් වේ. කාණ්ඩ තුනම අඩංගු මිශ්‍ර ආහාර වේලක් සහ පිරිසිදු ජලය ප්‍රමාණවත්ව ගැනීම නීරෝගී පැවැත්මට හේතු වේ.

ඡේදය ඇසුරෙන් **පමණක්** පිළිතුරු සපයන්න.

(i) ශක්තිජනක කාණ්ඩයට අයත් ආහාරයක් ලියන්න. ..........................................

(ii) ශක්තිජනක කාණ්ඩය හැර අනෙක් ආහාර කාණ්ඩ **දෙක** ලියන්න.

(1) ..............................................

(2) ..............................................

(iii) 'ඇතුළත්' යන්නට සමානාර්ථයක් දෙන වචනයක් තෝරා ලියන්න. ..............................

(iv) නීරෝගී පැවැත්ම සඳහා, මිශ්‍ර ආහාර වේලකට අමතරව ගත යුතු වන්නේ මොනවා ද?

..........................................

(v) ඡේදයට වඩාත්ම සුදුසු මාතෘකාව තෝරා යටින් ඉරක් අඳින්න.

(1) නීරෝගී පැවැත්ම සඳහා සුදුසු ආහාර පාන

(2) නීරෝගී පැවැත්ම සඳහා ජලය පානය කිරීම

(3) මිශ්‍ර ආහාර වේලකට අයත් ආහාර කාණ්ඩ

**2.** පහත සඳහන් යෙදුම් පැහැදිලි කර තිත් ඉරි මත ලියන්න.

(i) ඇහැ ගහගෙන ඉන්නවා : ..................................................................

(ii) කටේ අගුළු වැටිලා : ..................................................................

**3.** ගැළපෙන විරාම ලකුණු යොදන්න.

(i) ඔබේ පුතා කෝ

(ii) හෙට එනවා කියූ ඔබ අදම ඇවිත්

**4.** "**අරුණෝගී** කුරුලු කිචි බිචිය ඉතා සුන්දර ය."

මෙහි **අරුණෝගී** යන පදයෙහි තේරුම ලියන්න : ..............................................

**5.** නිවැරදි ක්‍රියා පදය යටින් ඉරක් අඳින්න.

(i) උණ පඳුරු සර සර හඬ (නඟයි / නඟති).

(ii) ඇතැමෙක් තම සතුට පළ (කළේය / කළෝය).

**6.** මෙම වැකි, **ලේඛන** වහරට හරවා ලියන්න.

(i) එළදෙන්නු තණකොළ කෑවා.

: ..................................................................

(ii) අපි සරුංගල් යවන්න පිට්ටනියට ගියා.

: ..................................................................

**7.** සුදුසු වචනය යොදා හිස්තැන පුරවන්න.

පනින රිළවුන්ට .................................. බැන්දා වගෙයි.

[තුන්වැනි පිටුව බලන්න.

**8.** දී ඇති වචන ගළපා අර්ථවත් වාක්‍යයක් ලියන්න.

සාගරය / සඳකිරණින් / විය. / දියඹට / වැටුණු / බැබළෙන්නට

.................................................................................................................................

**9.** නිවැරදි අක්ෂර වින්‍යාසය සහිත වචනය යටින් ඉරක් අඳින්න. ( පැලැටි / පැළෑටි )


**10.** පොත්පත් කියවන්නා යන අර්ථය දෙන වචනය යටින් ඉරක් අඳින්න. ( රචකයා / පාඨකයා )

**11.** **යුගල පදය** සම්පූර්ණ කරන්න. සිරිත් ....................

**12.** එක් එක් ඉංග්‍රීසි වචනයෙහි අර්ථය සිංහලෙන් ලියන්න.

(i) Playground : .................................. (ii) Friend : ......................................

**13.** එක් එක් රූපයට ගැළපෙන ඉංග්‍රීසි වචනය, ඉංග්‍රීසි අකුරෙන්ම ලියන්න.

(i) 

(ii) 

............................... ...............................

**14.** පහත දී ඇති වචන නිවැරදිව ගළපා අර්ථවත් වැකියක් බැගින් ලියන්න.


(i) is / That / tree / a / mango : ...........................................................................

(ii) drinking / am / I / water : ...........................................................................

**15.** (i) 'මා මරම්' යන දෙමළ වචනයේ අර්ථය **සිංහලෙන්** ලියන්න. ..........................................

(ii) මෙම වාක්‍යය දෙමළෙන් කියන ආකාරය **සිංහලෙන්** ලියන්න.

ඔයාගේ වයස කීය ද? : ...........................................................................

**16.**  රවුම තුළ ඇති ඉලක්කම් හතරම යොදාගෙන සෑදිය හැකි **කුඩාම** සංඛ්‍යාව ලියන්න.



: ..............................

**17.** දී ඇති සංඛ්‍යා **ආරෝහණ** පටිපාටියට ලියන්න.

3506, 2605, 3650, 2560 : ...................., ...................., ...................., ....................

**18.** දී ඇති සංඛ්‍යා රටාවල හිස්තැනට සුදුසු සංඛ්‍යාව ලියන්න.

(i) 24, 32, 40, 48, . . . (ii) 8, 16, 32, . . . , 128

**19.** වෙළෙන්දෙක් මිලට ගත් පොල් ගෙඩි 256 කින් $\frac{3}{4}$ ක් විකුණුවේය.

ඔහු විකුණූ පොල් ගෙඩි ගණන කීය ද? : ..................

**20.** අභ්‍යාස පොත් 608 ක් එක් පෙට්ටියකට 6 බැගින් වන සේ පෙට්ටිවල ඇසිරීමට අවශ්‍ය වේ.

(i) පොත් 6 බැගින් ඇසිරීමට අවශ්‍ය වන පෙට්ටි ගණන කීය ද? : ....................

(ii) එවිට පොත් කීයක් ඉතුරු වේ ද? : ....................

**21.** වගුවෙහි දැක්වෙන තොරතුරු ඇසුරෙන් පිළිතුරු සපයන්න.

| පාසල | *A* | *B* | *C* | *D* |
|---|---|---|---|---|
| ශිෂ්‍ය සංඛ්‍යාව | 2285 | 2032 | 890 | 1318 |

(i) *A* සහ *D* පාසල් දෙකෙහි සිටින මුළු ශිෂ්‍ය සංඛ්‍යාව කීය ද? : ....................

(ii) *C* පාසලට වඩා *B* පාසලෙහි ශිෂ්‍යයෝ කීදෙනෙක් වැඩියෙන් සිටිත් ද? : ....................

**22.** ප.ව. 7.45 ට කොළඹින් පිටත් වූ බස් රථයක් පසුදින පෙ.ව. 4.15 ට යාපනයට ළඟා විය. ගමනට ගත වූ මුළු කාලය කොපමණ ද?

: පැය ............ මිනිත්තු ............


**23.** ධාරිතාව ලීටර 2 මිලිලීටර 500 ක් වන භාජනයක් සම්පූර්ණයෙන් පිරවීමට ධාරිතාව මිලිලීටර 500 ක් වන භාජනයකින් කී වාරයක් ජලය දැමිය යුතු ද?

: ....................

**24.** 



*A*, *B*, *C* නගර තුනක පිහිටීම රූපයේ දැක්වේ. *A* සහ *B* අතර දුර 45 km කි. *A* සහ *C* අතර දුර 161 km කි. *B* සහ *C* අතර දුර කොපමණ ද?

: .................. km

**25.** 


රූපයේ දැක්වෙන්නේ ධාරිතාව 400 ml වන භාජනයකි. එහි කොටසක් ජලයෙන් පුරවා ඇත. එම භාජනය සම්පූර්ණයෙන් පිරවීමට තව කොපමණ ජලය අවශ්‍ය වේ ද?

: .................. ml

**26.** 

රූපයේ පාට කර ඇති කොටස දහයෙන් පංගුවක් ලෙස දක්වන්න.


: ....................

**27.** පහත බිල්පත සම්පූර්ණ කරන්න.

| ද්‍රව්‍යය | 1 kg ක මිල | | ප්‍රමාණය | මිල | |
|---|---|---|---|---|---|
| | රුපියල් | සත | | රුපියල් | සත |
| සීනි | 120 | 00 | 500 g | 60 | 00 |
| තේ කොළ | 850 | 00 | 100 g | ... | 00 |
| කිරි පිටි | ... | 00 | 250 g | 150 | 00 |
| මුළු මුදල | | | | ... | 00 |

[පස්වැනි පිටුව බලන්න.

**28.** ඔරලෝසු මුහුණතේ දැක්වෙන වේලාව කීය ද?




වේලාව : .....................

**29.** සිසුන් කණ්ඩායමක් වඩාත්ම කැමති පලතුර පිළිබඳ තොරතුරු ප්‍රස්තාරයේ නිරූපණය කර ඇත.


(i) කෙසෙල්වලට කැමති සිසුන් සංඛ්‍යාව 9 කි. එය ප්‍රස්තාරයේ ඇඳ දක්වන්න.

(ii) සිසුන් වැඩිදෙනකු කැමති පලතුර කුමක් ද?

: ......................

එම පලතුරට කැමති සිසුන් සංඛ්‍යාව කීය ද?

: ......................




- අංක **30** සිට **59** තෙක් එක් එක් ප්‍රශ්නයට සුදුසු පිළිතුර, දී ඇති පිළිතුරු අතුරෙන් තෝරා යටින් ඉරක් **අඳින්න**.

**30.** ඒක දේශික ශාක පමණක් අඩංගු පිළිතුර තෝරන්න.

(1) දුම්මල, මා වේවැල්, බිං කොහොඹ
(2) අඹ, මා වේවැල්, දෙල්
(3) රඹුටන්, අලිගැටපේර, අඹ
(4) රඹුටන්, දෙල්, දුම්මල

**31.** ජලයෙන්, සුළඟින් සහ සතුන් මගින් ව්‍යාප්ත වන බීජ පිළිවෙළින් ඇතුළත් පිළිතුර කුමක් ද?

(1) හොර, පොල්, අඹ
(2) කදුරු, හොර, කජු
(3) කදුරු, අඹ, පොල්
(4) කජු, අඹ, හොර

**32.** සතුන්ගෙන් ශාකවලට සිදුවන යහපත් ක්‍රියාවක් වන්නේ,

(1) දිමියන් ශාක පත්‍ර එකතු කොට දිම්ගොටු සෑදීමයි.
(2) වවුලන් ශාකවල බීජ තැන තැන දැමීමයි.
(3) ඉත්තෑවන් ශාකවල අල, මුල් ආහාරයට ගැනීමයි.
(4) සමහර වන සතුන් වනයේ ශාක පෙරළා දැමීමයි.

**33.** පැළෑටිවල කොළ ආහාරයට ගන්නා සතෙකි,

(1) මී මැස්සා. (2) සමනළයා. (3) දළඹුවා. (4) බට්ටිච්චා.

**34.** ඒක දේශික ක්ෂීරපායි සතෙකි,

(1) බකමූණා. (2) වවුලා. (3) හික්මීයා. (4) ගස්ගෙම්බා.

**35.** මැස්සන් නිසා පැතිරීමට ඉඩ ඇති රෝගයකි,

(1) මැලේරියාව. (2) මහාමාරිය. (3) ජලභීතිකාව. (4) පාචනය.


**36.** අපිරිසිදු ජලය පානය කිරීම නිසා ඇති විය හැකි රෝගයකි,

(1) බරවා. (2) ඩෙංගු. (3) කොළරාව. (4) චිකුන්ගුන්‍යා.

**37.** පහත දැක්වෙන ඒවා අතුරෙන් මේදය වැඩියෙන්ම ඇති ආහාරය තෝරන්න.

(1) කඩල (2) සෝයා බෝංචි (3) රටකජු (4) කව්පි

**38.**




රූපවල දක්වා ඇති මුං බීජ සහිත බඳුන් දින කිහිපයකට පසු නිරීක්ෂණය කළ විට මුං බීජ පැළවී ඇති බව දක්නට ලැබෙන්නේ කුමන භාජනයේ ද?

(1) *A* (2) *B* (3) *C* (4) *D*

**39.** වැසි රහිත දිනවල අලුයම මෙන්ම සැඳෑ කාලයේත් අහසේ පැහැදිලිව දිස්වන ග්‍රහ වස්තුව වන්නේ,

(1) සිකුරු ය. (2) අඟහරු ය.
(3) සෙනසුරු ය. (4) බ්‍රහස්පති ය.

**40.** යමකු ක්ලාන්ත වූ විටෙක වහාම කළ යුතු වන්නේ,

(1) ශරීරය හොඳින් ආවරණය කිරීමයි.
(2) හොඳින් වාතාශ්‍රය ලබාදීමයි.
(3) සිසිල් ජලය පානය කිරීමට සැලැස්වීමයි.
(4) මුඛය තුළට හැන්දක් ඇතුළු කිරීමයි.

**41.** පොළොවෙහි වැඩෙන ශාකයක් ජලය හා පෝෂක ලබා ගන්නේ,

(1) මුල් මගිනි. (2) පත්‍ර මගිනි.
(3) මල් මගිනි. (4) බීජ මගිනි.

**42.** සෙක්කුව යොදා ගනු ලබන්නේ,

(1) ඇණ ගැසීමට ය. (2) කළු ගල් කැඩීමට ය.
(3) තෙල් සිඳීමට ය. (4) බර ඇදීමට ය.

**43.** මදුරුවන් මර්දනය කිරීම සඳහා සුදුසු ක්‍රියාමාර්ගයක් **නොවන්නේ**,

(1) වටපිටාව පිරිසිදු ව තබා ගැනීමයි.
(2) මදුරුතලා කොළ පුළුස්සා දුම් ගැසීමයි.
(3) ජලය රැස් වන ස්ථාන නැති කර දැමීමයි.
(4) ජලය ඇමූ භාජන මත මල් දැමීමයි.

**44.** පොළොව මත එකතු වන විවිධ අපද්‍රව්‍ය කැබලි කොට ඒවා දිරාපත් කිරීමට උදව් වන සතෙකි,

(1) ගොළුබෙල්ලා. (2) දිමියා. (3) වේයා. (4) කැරපොත්තා.

**45.** ශ්‍රී ලංකාවේ ජාතික ක්‍රීඩාව කුමක් ද?

(1) දැල් පන්දු (2) අත් පන්දු (3) ක්‍රිකට් (4) එල්ලේ

**46.** අඬු කැබලි සිටුවීමෙන් පැළ ලබා ගත හැකි බෝග **දෙකකි**,


(1) මඤ්ඤොක්කා සහ නිවිති. (2) බඩ ඉරිඟු සහ මඤ්ඤොක්කා.
(3) බඩ ඉරිඟු සහ නිවිති. (4) මාළු මිරිස් සහ කංකුං.

**47.** 'දිය හොල්මන' යනු,

(1) ජලාශ ආශ්‍රිතව වාසය කරන සත්ත්වයෙකි.
(2) වගා බිම්වල සැරිසරන නිශාචර සත්ත්වයෙකි.
(3) ජනප්‍රවාදයේ ඇති කතාවක අද්භූත චරිතයකි.
(4) සතුන්ගෙන් වගා රැක ගැනීමට යොදා ගැනෙන ඇටවුමකි.

**48.** *A*, *B*, *C* නම් කුඩා බල්බ තුනක්, යකඩ ඇණ 3 ක්, වියළි කෝෂයක්, ලෝහ ඇමුණුම් කටු දෙකක් හා වයර් කැබලි කිහිපයක් යොදා ගෙන ලෑලි කැබැල්ලක් මත රූපයේ දැක්වෙන ආකාරයේ ඇටවුමක් සකස් කර ඇත. මෙම ඇටවුම අනුව දැල්වෙන්නේ,

(1) *A* බල්බය පමණි. (2) *B* බල්බය පමණි.
(3) *C* බල්බය පමණි. (4) *A*, *B*, *C* බල්බ තුනම.




**49.** පොලිසිය සමහර සෝදිසි කිරීමේ කටයුතුවලදී පුහුණු කරන ලද සුනඛයන් යොදාගනියි. එහිදී ප්‍රධාන වශයෙන් උපයෝගී කරගනු ලබන්නේ සුනඛයන්ගේ කුමන ගුණාංගය ද?

(1) හොඳින් ඇස් පෙනීම
(2) හොඳින් කන් ඇසීම
(3) තියුණු ඉව
(4) වේගයෙන් දිවීම

**50.** රූපයේ දැක්වෙන මාර්ග සංඥාවෙන් කියවෙන පණිවිඩය කුමක් ද?



(1) වර්ණ සංඥා ඉදිරියෙනි.
(2) වාහන නවතා තැබීම ඉදිරියෙනි.
(3) පහළට බෑවුම් සහිත පාර ඉදිරියෙනි.
(4) වසා ඇති පාර ඉදිරියෙනි.

**51.** ශ්‍රී ලංකා රාජ්‍ය ලාංඡනයෙහි 'සෞභාග්‍යය' මූර්තිමත් වීම සඳහා යොදා ඇති සංකේතයකි,

(1) පුන් කලස. (2) වී කරල්. (3) ධර්ම චක්‍රය. (4) ඉර සහ හඳ.

**52.** බරැති යමක් එක් තැනකින් තවත් තැනකට රැගෙන යෑම සඳහා යොදා **නොගැනෙන** උපකරණයකි,

(1) දොඹකරය. (2) කප්පිය. (3) විල්බැරෝව. (4) ඩැහි අඬුව.

**53.** අයිස් කැට කිහිපයක් වීදුරුවකට දමා මිනිත්තු කිහිපයක් එළියේ තැබූ විට නිරීක්ෂණය කළ **නොහැකි වන්නේ**,

(1) අයිස් කැට දියවී ඇති බවයි.
(2) වීදුරුවේ ජලය එකතුවී ඇති බවයි.
(3) වීදුරුවෙන් වායු බුබුළු පිටවන බවයි.
(4) වීදුරුවේ පිටත තෙත්වී ඇති බවයි.

**54.** මහවැලි ගඟ සහ වලවේ ගඟ මුහුදට වැටෙන ස්ථාන දෙක පිළිවෙළින්,

(1) මඩකලපුව සහ අම්බලන්තොට වේ.
(2) මඩකලපුව සහ හම්බන්තොට වේ.
(3) ත්‍රිකුණාමලය සහ කතරගම වේ.
(4) ත්‍රිකුණාමලය සහ අම්බලන්තොට වේ.

**55.** පහත දැක්වෙන ක්‍රීඩා අතුරෙන් කායික ශක්තිය වැඩිපුරම වැය වන ක්‍රීඩාව වන්නේ,

(1) දාං ඇදීමයි. (2) කඹ ඇදීමයි. (3) පංච දැමීමයි. (4) කැරම් ගැසීමයි.

**56.** ජාතික ගීය ගායනා කරන විට පැවැත්විය යුතු නිවැරදි ඉරියව්වක් **නොවන්නේ**,

(1) සීරුවෙන් සිටීමයි.
(2) පහසුවෙන් සිටීමයි.
(3) ශරීරය ඍජු ව තබා ගැනීමයි.
(4) දෙඇස් විවෘත ව තබා ගැනීමයි.

**57.** ස්වාභාවික මල් සහ පත්‍රවලින් සුබ පැතුම් පතක් සකස් කිරීමේ පියවර හතරක් මෙසේ ය.

*A* - වියළා ගත් මල් හා පත්‍ර අවශ්‍ය පරිදි ඇලවීම
*B* - අවශ්‍ය ප්‍රමාණයට කඩදාසියක් කපා ගැනීම
*C* - ස්වාභාවික මල් සහ පත්‍ර පොතක පිටු අතර වියැළෙන්නට තැබීම
*D* - සුදුසු සුබ පැතුමක් හෝ ප්‍රාර්ථනාවක් ලිවීම

ඒවායේ නිවැරදි අනුපිළිවෙළ කුමක් ද?

(1) *A, D, C, B* (2) *B, A, C, D* (3) *C, B, A, D* (4) *C, D, A, B*

**58.** ස්වාභාවික සුළං බලය යොදාගැනෙන අවස්ථාවකි,

(1) බැලූනයක් පිම්බීම. (2) බටනලා වාදනය.
(3) ටයරයකට වායුව පිරවීම. (4) සරුංගලයක් යැවීම.

**59.** රූපයේ දැක්වෙන ලාංඡනය මගින් නිරූපණය වන්නේ,

(1) ශ්‍රී ලංකා ගුවන් සේවයයි.
(2) ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාවයි.
(3) ශ්‍රී ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවයි.
(4) ශ්‍රී ලංකා තැපැල් සේවයයි.

**60.** "චිත්‍ර තරගයකින් පළමුවන ස්ථානය දිනූ කුමුදුට චිත්‍ර ප්‍රදර්ශනයක් නැරඹීමට ජපානයට යෑම සඳහා ආරාධනයක් ලැබුණි. කුමුදු ඔබ යැයි සිතා, මේ අවස්ථාවේ ඔබට සිතුණු දේ පිළිබඳව වාක්‍ය **තුනක්** ලියන්න. (සෑම වාක්‍යයක් ම වචන පහකට නොඅඩු විය යුතුයි. උක්ත ආඛ්‍යාත සම්බන්ධය හා අක්ෂර වින්‍යාසය නිවැරදි විය යුතුයි.)

1. ..........................................................................................

..........................................................................................

2. ..........................................................................................

..........................................................................................

3. ..........................................................................................

..........................................................................................

***